සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2021 ජූලි

## (203) ව්‍යාපාර නීතිය

(Business Law)

2021-10-23
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  - (4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.6 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 පහත සඳහන් ඒවා අතුරෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථකථනය කිරීමේ නෛතික බලය තිබෙන්නේ කුමන උසාවියට ද?

(1) අභියාචනාධිකරණයට. (2) මහේස්ත්‍රාත් උසාවියට.

(3) මහාධිකරණයට. (4) ශ්‍රේෂ්ඨාධිකරණයට.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලිකාංගයක් **නොවන්නේ** කුමක් ද?

(1) පුරවැසිභාවය පිළිබඳ ප්‍රතිපාදනය. (2) අධිකරණ සේවා කොමිසම.

(3) ආයෝජන මණ්ඩලයේ කාර්යයන්. (4) මූලික අයිතින්.

1.3 පහත සඳහන් ඒවා අතුරෙන්, භාණ්ඩ විකිණීමේ ගිවිසුම යටතේ ව්‍යංග කොන්දේසියක් **නොවන්නේ** කුමක් ද?

(1) භාණ්ඩ, විස්තරයක් මගින් විකුණන අවස්ථාවේදී, එම භාණ්ඩ, විස්තරයට අනුකූල විය යුතුයි.

(2) සපයන ලද භාණ්ඩ අරමුණ සමග එකඟ විය යුතුයි.

(3) භාණ්ඩ, වෙළෙඳ ගුණත්වයකින් (quality) යුක්ත විය යුතුයි.

(4) කිසිදු මැදිහත් වීමකින් තොරව භාණ්ඩයේ අයිතිය ගැනුම්කරුට තිබිය යුතුයි.

1.4 පහත සඳහන් වැරදි සලකා බලන්න:

**(a)** භාණ්ඩ විකිණීම ප්‍රතික්ෂේප කිරීම.

**(b)** භාණ්ඩවල අයිතිය ප්‍රතික්ෂේප කිරීම.

**(c)** නීත්‍යානුකූල නොවන මුදල්, නීත්‍යානුකූල මූල්‍ය සාධන පත්‍රවල ආයෝජනය කිරීම.

ඉහත සඳහන් දෑ අතුරින්, 2003 අංක 9 දරණ පාරිභෝගික කටයුතු අධිකාරී පනත යටතේ ප්‍රධාන වැරදි වන්නේ:

(1) **(a)** සහ **(c)** පමණි. (2) **(a)** සහ **(b)** පමණි.

(3) **(b)** සහ **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම.

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, වලංගු විනිමය බිල්පතක ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?

(1) එය කොන්දේසි විරහිතව දරණු ලැබේ.

(2) එය ලිඛිත විය යුතුය.

(3) එය කල් පවතින තීන්තවලින් මුද්‍රණය කර තිබිය යුතුයි.

(4) එය නිකුත් කරනු ලබන පුද්ගලයා විසින් අත්සන් කළ යුතුයි.

1.6 ගනුදෙනුකළ හැකි උපකරණ සම්බන්ධයෙන් වන නීතිය යටතේ යථාකාලීන දරන්නා (holder in due course) සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න:

**(a)** බිල්පත සඳහා වටිනාකම ලැබීමේදී මූලිකත්වය දෙනු ලැබේ.

**(b)** බිල්පත මත අයිතීන් නැවත ලබාගැනීමට සියලුම පෙර පාර්ශවයන් වෙත නඩු පැවරිය නොහැකි වේ.

**(c)** ගනුදෙනු කිරීම මගින් ඔහුගේ අයිතිය (title) පැවරිය හැකිය.

ඉහත සඳහන් ඒවා අතුරින්, නිවැරදි ප්‍රකාශ වන්නේ:

(1) **(a)** සහ **(b)** පමණි. (2) **(a)** සහ **(c)** පමණි.

(3) **(b)** සහ **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 12)

*අංක **1.7** සිට **1.9** දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.7** නියෝජ්‍යත්වයක් අවශ්‍යතාවය මත ඇති වන්නේ නම්, ප්‍රධානියා, නියෝජිතයාගේ ක්‍රියාකරකම් මත වගකීමට බැඳෙනු නොලැබේ.

**1.8** CIF ගිවිසුමකදී, භාණ්ඩ නැවට පැටවීමෙන් පසුව ගිවිසුම සම්බන්ධයෙන් විකුණුම්කරුගේ වගකීම අවසන් වේ.

**1.9** වෙන්දේසියකදී, විකිණීම සම්පූර්ණ කිරීමෙන් පසු වෙන්දේසිකරුට භාණ්ඩවල අයිතිය නොමැති වුවද, ගැනුම්කරු විසින් හොඳ හිමිකමක් අත්පත් කර ගනී. (එකකට ලකුණු 01 බැගින්, ලකුණු 03)

*අංක **1.10** සිට **1.14** දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.10** ශ්‍රී ලංකාවේ තිබෙන නියාමන ආයතන (regulatory institutions) දෙකක්(02) සඳහන් කරන්න.

**1.11** භාණ්ඩ විකුණීමේ ගිවිසුමක මූලිකාංග දෙකක්(02) සඳහන් කරන්න.

**1.12** මූල්‍ය බුද්ධි ඒකකයේ අරමුණු දෙකක්(02) සඳහන් කරන්න.

**1.13** 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනතේ 5 වන වගන්තිය යටතේ "තොරතුරුවලට ප්‍රවේශය තහනම්" වන අවස්ථා දෙකක්(02) සඳහන් කරන්න.

**1.14** චෙක්පතක් රේඛණය කිරීම සම්බන්ධයෙන් 'අණකරුගේ' බලතල දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)
(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

### 02 වන ප්‍රශ්නය

එක්ස්ප්‍රස් පර්ල් (Xpress Pearl) නෞකාව මගින් සිදුවූ පරිසර දූෂණයට සමගාමීව ශ්‍රී ලංකාවේ නිවැසියන්ගේ භාවිතය සඳහා වන "සුදු ලුණු" (White Salt) සඳහා ඉල්ලුම ද අනපේක්ෂිත ලෙස වැඩිවිය. 2018 වර්ෂයේ සිට **සරත්, සීමාසහිත වයිට් සෝල්ට් (පෞද්ගලික) සමාගමේ** නියෝජිතයෙකු ලෙස කටයුතු කරන ලදී. "සුදු ලුණු" පැකැට්ටුවක උපරිම සිල්ලර මිල රු.50/- ක් විය. "සුදු ලුණු" වලින් සම්පූර්ණයෙන්ම පිරී පැවති ගබඩා හතරක පාලනය **සරත්** සතුවිය. "සුදු ලුණු" සඳහා පැවති වෙළෙඳපොළ ඉල්ලුම සපුරාලීමට **සරත්** ට අවශ්‍ය වූ අතර, වෙළෙඳපොළ සඳහා අවශ්‍ය සාමාන්‍ය සැපයුමට වඩා වැඩි "සුදු ලුණු" ප්‍රමාණයක් ඔහු වෙත ලබාගැනීම සඳහා **සරත්,** ගබඩා කළමනාකරුවෙකු සමඟ නෛතික නොවන ගනුදෙනුවක් සිදුකරන ලදී. පසුව, "සුදු ලුණු" පැකට්ටුවක් රු.100/- බැගින් **සරත්** විසින් විකුණා ඇති බවත් එම ගනුදෙනුව හරහා **සරත්** රු. මිලියන 5 ක අතිරේක ලාභයක් උපයා ඇති බවත් **සීමාසහිත වයිට් සෝල්ට් (පෞද්ගලික) සමාගම** තහවුරු කරගන්නා ලදී. ඒ අතරතුර, **සරත්** විසින් සිදුකරන ලද, වැඩි මිලකට "සුදු ලුණු" විකිණීමේ ක්‍රියාව සම්බන්ධයෙන් **සීමාසහිත වයිට් සෝල්ට් (පෞද්ගලික) සමාගම ට** එරෙහිව ශ්‍රී ලංකා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් විමසීමකට මුලපුරා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සරත්** ට එරෙහිව **සීමාසහිත වයිට් සෝල්ට් (පෞද්ගලික) සමාගමේ** නෛතික අයිතිවාසිකම් **විමසන්න**. (ලකුණු 06)

(b) ලකුණු කරන ලද සිල්ලර මිලට වඩා වැඩි මිලකට ලුණු පැකට් විකිණීම සම්බන්ධයෙන් **සීමාසහිත වයිට් සෝල්ට් (පෞද්ගලික) සමාගම** වගකීමට බැඳේ ද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

**රාජා** විසින් 2010 වර්ෂයේදී **ස්ටාර් ඉන්ෂුවරන්ස් සමාගමෙන්** ඔහුට ජීවිත රක්ෂණයක් ලබාගන්නා ලද අතර, එහි ප්‍රතිලාභීන් (beneficiaries) වශයෙන් ඔහුගේ බිරිඳ **සීතා** සහ දරු දෙදෙනා වන **ටීනා** සහ **මීනා** නම් කරන ලදී. කිසිදු පැහැරහැරීමකින් තොරව ඔහු විසින් ඔහුගේ ජීවිත රක්ෂණ ඔප්පුව සඳහා වන වාරිකයන් ක්‍රමානුකූලව ගෙවන ලදී. 2021 මැයි මාසයේදී කොවිඩ්-19 (COVID-19) හේතුවෙන් **රාජා** ජීවිතක්ෂයට පත්විය. ඔහුගේ වියෝව හේතුවෙන් **සීතාටත්** ඔහුගේ දරු දෙදෙනාටත් මූල්‍ය අපහසුතා රැසකට මුහුණදීමට සිදුවිය. **සීතා** විසින් ඔහුගේ ස්වාමිපුරුෂයාගේ ජීවිත රක්ෂණ ඔප්පුව සඳහා වන වන්දිය ලබාගැනීම සඳහා **ස්ටාර් ඉන්ෂුවරන්ස් සමාගම** අමතන ලදී. **සීතා** විසින් යොමුකරන ලද වන්දි අයදුම්පත (claim form) **ස්ටාර් ඉන්ෂුවරන්ස් සමාගම** විසින් ප්‍රතික්ෂේප කරන ලද අතර, එයට හේතුව ලෙස **රාජා** විසින් ලබාගන්නා ලද ජීවිත රක්ෂණ ඔප්පුව මගින් කොවිඩ්-19 (COVID-19) හේතුවෙන් සිදුවන මරණය ආවරණය වී නොමැති බව දන්වන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සිදුවීම සම්බන්ධයෙන් "රක්ෂණයේ ආසන්නතම හේතුව" යන මූලධර්මයේ අදාළත්වය **විමසන්න**. (ලකුණු 06)

(b) **රාජා** වෙනුවෙන් ජීවිත රක්ෂණ ඔප්පුව **සීතා** විසින් ලබාගෙන තිබුණේ නම් සහ **රාජාගේ** වියෝව මෝටර් රථ අනතුරක් මගින් සිදුව තිබුනේ නම්, රක්ෂණ හිමිකම යන මූලධර්මයේ අදාළත්වය **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

**සීමාසහිත ABC පොදු සමාගම,** 2015 වර්ෂයේදී 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සමාගමකි. **සීමාසහිත ABC පොදු සමාගමේ** සාංගමික ව්‍යවස්ථාවලියේ දැක්වෙන පරිදි එම සමාගමේ ප්‍රධාන අරමුණ වනුයේ වගා කිරීම්, පැළ සිටුවීම්, එළ නෙළීම සහ ගබඩා කිරීම යනාදී කෘෂිකාර්මික කටයුතුවල නියැලීම වේ. තවද, **සීමාසහිත ABC පොදු සමාගමේ** සාමාජිකයන් සහ සමාගම අතර ඇතිවන ආරවුල් බේරුම්කරණය (arbitration) මගින් විසඳාගත යුතු බවටද **සීමාසහිත ABC පොදු සමාගමේ** සාංගමික ව්‍යවස්ථාවලියේ වගන්තියක ඇතුළත් වේ.

කෙසේවෙතත්, කොවිඩ්-19 (COVID-19) වසංගතය හේතුවෙන්, **සීමාසහිත ABC පොදු සමාගමේ** අධ්‍යක්ෂකවරයෙකු වන **රාජමෝහන්** විසින් කල්බදු පහසුකමක් යටතේ එකක පිරිවැය ඇමරිකානු ඩොලර් (US $) 150,000 ක් බැගින් වූ උපකරණවලින් සම්පූර්ණයෙන්ම සමන්විත වූ ගිලන් රථ 03 ක් මිලදී ගැනීමට යෝජනා කරන ලදී. ඔහුගේ යෝජනාව වූයේ මෙම ගිලන් රථ පෞද්ගලික රෝහලක් වෙත කුලී පදනම මත ලබා දී ඒවායින් කුලී ආදායමක් ඉපයීමයි. **සීමාසහිත ABC පොදු සමාගමේ** ප්‍රධාන කොටස්කරුවෙකු වන **සකීර්**, මෙම යෝජනාව සම්බන්ධයෙන් සමාගම සමඟ ආරවුලක් ඇතිකරගෙන අධිකරණය වෙත යොමු විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සිද්ධිය සම්බන්ධයෙන් **සීමාසහිත ABC පොදු සමාගමේ** සාංගමික ව්‍යවස්ථාවලියේ වලංගුභාවය **විමසන්න**.
(ලකුණු 07)

(b) සමාගමක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්වීමට සුදුසුකම් **නොලබන** පුද්ගලයන් තුනක්(03) **සඳහන් කරන්න**.(ලකුණු 03)

(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

**වෛද්‍ය ජීවක,** නගරයේ සුප්‍රසිද්ධ වෛද්‍ය වෘත්තිකයෙකි. ඔහු, **සදා සුව රෝහලේදී** සවස් භාගයේදී රෝගීන් පරීක්ෂා කරනු ලබයි.

**සදා සුව රෝහලේ** ඔහුගේ සේවා නියුක්තියට අදාලව පහත විකල්පයන් දෙක (2) දී ඇත:

<u>1 වන විකල්පය</u>:

එක් රෝගියෙකු පරීක්ෂා කිරීම සඳහා රු.2,000/- ක් බැගින් අයකරනු ලබන අතර, එයින් 50% ක් **වෛද්‍ය ජීවකගේ** ගාස්තුව වශයෙන්ද, ඉතිරිය රෝහල් ගාස්තුව වශයෙන්ද අයකරනු ලැබේ.

<u>2 වන විකල්පය</u>:

**සදා සුව රෝහල** මගින් රු.200,000/- ක් බැගින් වූ ස්ථාවර මාසික වැටුපක් **වෛද්‍ය ජීවක** වෙත ගෙවනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සඳහන් එක් එක් විකල්පය යටතේ **වෛද්‍ය ජීවක, සදා සුව රෝහලේ** සේවකයෙකු (සේවා නියුක්තිකයෙකු) වන්නේදැයි **විමසන්න**. (ලකුණු 06)

(b) 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත [Employees Provident Fund (EPF) Act] යටතේ ආවරණය **නොවන** සේවකයින් වර්ග හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

(a) අන්තර්ජාතික වෙළඳාමේදී, භාණ්ඩ සඳහා ගෙවීම් කිරීමට නොයෙකුත් ක්‍රම භාවිත කරනු ලැබේ. අන්තර්ජාතික වෙළඳාමේ ගෙවීම් සම්බන්ධයෙන් ආනයනකරුගේ සහ අපනයනකරුගේ අපේක්ෂාවන් එකිනෙකට ප්‍රතිවිරුද්ධ වේ. ගැනුම්කරු විසින් ගනුදෙනු ක්‍රියාවලියේදී හැකිතරම් ප්‍රමාද වී ගෙවීම් සිදුකිරීමට අපේක්ෂා කරන අතර, විකුණුම්කරුගේ අපේක්ෂාව වනුයේ ඉක්මන් සහ ආරක්ෂාකාරී ක්‍රියාවලියකි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

අන්තර්ජාතික වෙළඳාමේ ගෙවීම් ක්‍රමයක් ලෙස ණයවර ලිපියක (Letter of Credit) කාර්යභාරය (role) **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(b) බුද්ධිමය දේපලක් යනු මිනිසෙකු තම බුද්ධිය මෙහෙයවා කරනු ලබන නිර්මාණයකි. එය ඕනෑම රටක ආර්ථික, සමාජයීය සහ තාක්ෂණික සංවර්ධනය කෙරෙහි විශාල දායකත්වයක් දක්වනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත යටතේ ආවරණය වන බුද්ධිමය දේපළ පහක්(05) **සඳහන් කරන්න**.

(ලකුණු 05)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

(A) **වීනා** සහ **ටෝනි,** ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ පිහිටා ඇති **සීමාසහිත හෙල්දි ලයිෆ් රෝහල් සමාගමේ** සැපයුම්කරුවන් වේ. 2020 මාර්තු මාසයේදී, රෝහල, 2020 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි වර්ෂ හතරක කාලච්ඡේදයක් සඳහා නැවුම් එළවළු මිලදී ගැනීමට **වීනා** සමග ගිවිසුමකට එළඹුණි.

**වීනා** සමඟ ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව, ගිවිසුම් වටිනාකමින් 50% ක අත්තිකාරම් ගෙවීමක් රෝහල විසින් **වීනා** වෙත සිදුකරන ලදී.

එදිනම, රෝහල **ටෝනි** සමගද 2020 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි වර්ෂ හතරක කාලච්ඡේදයක් සඳහා අත්‍යවශ්‍ය පිරිසිදුකාරක දියරයන් (cleaning liquid) මිලදී ගැනීම සඳහා තවත් ගිවිසුමකට එළඹුණි. කෙසේවෙතත්, **ටෝනි** වෙත කිසිදු අත්තිකාරම් ගෙවීමක් සිදු නොකරන ලදී.

**වීනා** සහ **ටෝනි** යන දෙදෙනාම මෙම භාණ්ඩ සති දෙකකට වරක් සැපයීමට එකඟ වූ අතර, අදාළ භාණ්ඩ ඉරිදා දිනයන්හි මධ්‍යම රාත්‍රිය වන විට රෝහල වෙත ලැබී තිබිය යුතුය.

මැයි මස පළමු සතියේදී, **වීනාගේ** රියැදුරෙකුට කොවිඩ්-19 (COVID-19) ආසාදනය වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සියලුම සේවකයින්ට ස්වයං-නිරෝධායනයට ලක්වීමට සිදුවිය. තවද, නිරෝධායන ඇඳිරි නීතිය පැනවීමත්, එය දිවයින පුරා ක්‍රියාත්මක වීමත් හේතුවෙන් 2020 ජූනි මාසය වන තුරු **වීනාට, සීමාසහිත හෙල්දි ලයිෆ් රෝහල් සමාගම** වෙත එළවළු සැපයීමට නොහැකි විය.

ඒ අතරතුර, **ටෝනි** ද අදාල නිෂ්පාදිත සඳහා පවතින අධික ඉල්ලුම නිසා ඒවායේ මිල විශාල වශයෙන් වැඩිවීම හේතුවෙන් ඔහුට එකඟ වූ පරිදි පිරිසිදුකාරක දියරයන් සැපයීමට නොහැකි බව **සීමාසහිත හෙල්දි ලයිෆ් රෝහල් සමාගම** වෙත දැනුම් දී ඇත.

ඉහත දක්වන ලද හේතු නිසාවෙන්, සැලකිය යුතු ප්‍රමාණයකින් රෝහල වෙත ඇතුළත් කරගනු ලබන රෝගීන් සංඛ්‍යාව අඩු කිරීමට ද රෝහලට සිදුවී ඇත. දැන් **වීනාට** සහ **ටෝනිට** එරෙහිව නෛතික ක්‍රියාමාර්ගවලට එළඹීමට රෝහල සැලසුම්කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) පහත සඳහන් දෑ **පැහැදිලි කරන්න**:

(i) **වීනා** සහ **සීමාසහිත හෙල්දි ලයිෆ් රෝහල් සමාගම** අතර වලංගු ගිවිසුමක් තිබේද යන්න. (ලකුණු 02)

(ii) **ටෝනි** සහ **සීමාසහිත හෙල්දි ලයිෆ් රෝහල් සමාගම** අතර වලංගු ගිවිසුමක් තිබේද යන්න. (ලකුණු 02)

(b) **වීනා** සහ **ටෝනි,** සම්බන්ධයෙන් **සීමාසහිත හෙල්දි ලයිෆ් රෝහල් සමාගමේ** නෛතික අයිතිවාසිකම් **විමසන්න**. (ලකුණු 07)

(c) **වීනා** සතු නෛතික අයිතිවාසිකම් සහ ප්‍රතිකර්ම (remedies) **විමසන්න**. (ලකුණු 04)

(B) මෝටර් රථ අලෙවි නියෝජිතයෙකු වන **සීමාසහිත රයිඩ් සමාගම**, රු. මිලියන 2 කට **මොහාන්ගෙන්** මෝටර් රථයක් මිලදී ගන්නා ලදී. **සීමාසහිත රයිඩ් සමාගම** එම මෝටර් රථය පින්තාරු (painted) කර ඔවුන්ගේ ප්‍රදර්ශනාගාරයේ තබා එය **කමල්** වෙත රු. මිලියන 2.5 කට විකුණන ලදී. මාස හතරකට පසු පොලිසිය මගින් එය සොරකම් කරන ලද මෝටර් රථයක් වීම නිසා එය ලබාගෙන (seized) එහි මුල් අයිතිකරු වෙත එය නැවත ලබාදෙන ලදී. **සීමාසහිත රයිඩ් සමාගම**, මෝටර් රථය සොරකම් කළ එකක් බව දැනගෙන සිටියේය. භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ **කමල්** විසින් **සීමාසහිත රයිඩ් සමාගම** වෙත ගෙවන ලද මුළු වටිනාකම ඉල්ලා සිටින ලදී. නමුත්, **කමල්** විසින් මාස හතරක කාලච්ඡේදය පුරාවට මෝටර් රථය පාවිච්චි කර තිබූ හෙයින් **සීමාසහිත රයිඩ් සමාගම** ගෙවන ලද මුළු මුදල වන රු. මිලියන 2.5 ගෙවීම ප්‍රතික්ෂේප කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) මෝටර් රථය සඳහා ගෙවන ලද මුළු මුදලම නැවත අයකර ගැනීමට **කමල්ට** හැකිවේද යන්න **විමසන්න**. (ලකුණු 07)

(b) භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ නොගෙවන ලද විකුණුම්කරුවෙකුට “භාණ්ඩවලට එරෙහිව” ඇති ප්‍රතිකර්ම (remedies) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |